# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2003 අගෝස්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 අගෝස්තු මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු.32.25 යි.　　තැපැල් ගාස්තුව : රු. 9.00 යි.

**2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2003 අගෝස්තු මස 20 වන දින]

එල්. ඩී.– ඕ. 53 /2001.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනතේ දීර්ඝ නාමයෙහි "ඉඩ ඒකකවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පිළිබඳ පාලනය හා කළමනාකරණය ගෙනයෑම, ඒවා නඩත්තු කරවීම සහ පරිපාලනය කිරීම සඳහා සහ ඒ ඒකකවලට පොදු පහසුකම් සැලැස්වීම සඳහා පොදු පහසුකම් මණ්ඩලය යනුවෙන්" යන වචන වෙනුවට "සහාධිපත්‍ය දේපළ, අර්ධ සහාධිපත්‍ය දේපළ සහ තාවකාලික සහාධිපත්‍ය දේපළවල පාලනය හා කළමනාකරණය ගෙන යෑම, ඒවා නඩත්තු කරවීම සහ පරිපාලනය කිරීම සඳහා සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය යනුවෙන්" යන වචන ආදේශ කිරීමෙන් එහි දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතිවල –

(අ) "පොදු පහසුකම් මණ්ඩල පනත" යන වචන වෙනුවට "සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත" යන වචන ;

(ආ) පොදු පහසුකම් මණ්ඩලය සඳහන් කරමින් "පොදු පහසුකම් මණ්ඩලය" සහ "මණ්ඩලය" යන වචන වෙනුවට "සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය" සහ "අධිකාරිය" යන වචන පිළිවෙලින් ආදේශ කරනු ලැබිය යුතු ය.

ජාතික රාජ්‍ය සභාවේ "පොදු පහසුකම් මණ්ඩල පනත", "පොදු පහසුකම් මණ්ඩලය" සහ "මණ්ඩලය" යන යෙදුම් "සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත", "සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය" සහ "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "පොදු පහසුකම් මණ්ඩල පනත" සහ "පොදු පහසුකම් මණ්ඩලය" සඳහා කරන ලද සෑම සඳහන් කිරීමක් ම "සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය" සඳහා කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

2—H 18077—4,500 (2003/05)

(ආ) සහාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සහාධිපත්‍ය දේපළවල පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් නිසි ආකාරයට හොඳින් නඩත්තු කරන බවට සහතික වීම සහ ඒ දේපළ මනා තත්ත්වයෙන් සහ සේවයට යොදවාගත හැකි අන්දමින් සහ නිසි ආකාරයෙන් නඩත්තු කිරීම සඳහා කලින් කල අලුත්වැඩියා කිරීම් කරන බවට සහතික වීම සහ ඒ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට සහාය වීම හෝ නැතහොත් ඒ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම කළමනාකරණ සංස්ථාව හෝ අයිතිකරු හෝ අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ පැහැරහරින අවස්ථාවක දී ඒ ක්‍රියාවලට සෘජුව ම මැදිහත්වීම ;

(ඇ) ගින්නෙන්, මහජන කැළඹීම්වලින් සහ කැරලි කෝලාහලවලින් වන උපද්‍රවවලට එරෙහිව සහාධිපත්‍ය කොටස් සංයුක්ත වන සියලු ගොඩනැගිලි රක්ෂණය කිරීමට හෝ රක්ෂණය වලංගුව තබාගන්නා ලෙස කළමනාකරණ සංස්ථාව විසින් හෝ අයිතිකරුවන් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ කරන බවට සහතික වීම සහ ඒ සඳහා වූ වාරික හෝ වෙනත් ගාස්තු අවස්ථාවෝචිත පරිදි කළමනාකරණ සංස්ථාවෙන් හෝ අයිතිකරුගෙන් ආපසු අයකර ගැනීම ;

(ඈ) සහාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරට හෝ අර්ධ සහාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරට පටහැනිව අදාළ අයිතිකරුවන් හෝ සහාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන් හෝ වෙනත් තැනැත්තකු විසින් ඉදිකරන ලද හෝ සිදුකර ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම ;

(ඉ) සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ කළමනාකරණ සංස්ථාව නිසි ආකාරයෙන් ක්‍රියාකරන බවට වගබලා ගැනීම සහ ඒ කළමනාකරණ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම ;

(ඊ) සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට ජලය, කසළ කාණු, ජලාපවහනය, ගෑස්, විදුලිය, කුණු කසළ බැහැර කිරීම, වායු සමීකරණය, දුරකථන, ගුවන් විදුලි සහ රෙඩිෆියුෂන් වැනි සේවා ලබාදීමේ දී ඒ අයිතිකරුට, අයිතිකරුවන්ට, පදිංචිකරුවන්ට සහායවීම ;

(උ) සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග, ප්‍රවේශයන්, තණ පිට්ටනි, වතු, උද්‍යාන, ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ස්ථාන පිහිටුවා නඩත්තු කිරීමට සහායවීම හෝ එවැනි පහසුකම් පිහිටුවීම සහ නඩත්තු කිරීමට අපොහොසත් වන විට කළමනාකරණ සංස්ථාව එවැනි ක්‍රියාවන් සඳහා සෘජුව ම මැදිහත් වීම ;

(ඌ) සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචි කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග, ප්‍රවේශයන්, වතු, උද්‍යාන, ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ස්ථාන නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතනයක් වෙත පැවරීම ;

(එ) සහාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සහාධිපත්‍ය දේපළවල සහාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාවේ හෝ ඒවායේ අයිතිකරුවන්ගේ හෝ පදිංචි

කරුවන්ගේ ඉල්ලීම පරිදි ඒ සහාධිපත්‍ය කොටස් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීමේ සේවා සැපයීම ;

(ඡ) පරදු දරන්නන්ගේ අයිතීන් ආරක්ෂාවීම සහතිකවීම සඳහා ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය දේපළ තැනීමේ ප්‍රගතිය නියාමනය කිරීම සහ ඒ අයිතීන් ආරක්ෂා කිරීමට අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී ඊට මැදිහත්වීම ;

(ට) රජය විසින් අනුමත කිරීම සඳහා ප්‍රාග්ධන ආයෝජන සැලසුම් ඇතුළු සහාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීමේ වැඩසටහන් සකස් කිරීම සහ අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඨ) රජය විසින් අනුමත කරනු ලබන වැඩ සටහන්වලින් සහාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාරගැනීමට හෝ ඒ ව්‍යාපෘති ක්‍රියාවේ යෙදවීමට භාර ගැනීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් හෝ නිවාස සංවර්ධන අධිකාරියෙකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ රජයේ යම් නියෝජිත ආයතනයකින් හෝ පෞද්ගලික සංවර්ධන කරුවකුගෙන් ඉල්ලා සිටීම ;

(ඩ) යම් ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක දැක්වෙන යම් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් අයිතිකරු විසින් අවසන් කිරීම පැහැර හැරීමේ දී එය අවසන් කිරීමට භාර ගැනීම ; සහ

(ඪ) අධිකාරියේ අරමුණුවලින් යම් අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ නැවත සංවර්ධනය කිරීම ;

(ඩ) ඉහත සඳහන් අරමුණු සියල්ලම හෝ ඉන් යම් අරමුණක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන වෙනත් සියලු දේ කිරීම,

යන මේවා විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අධිකාරියේ බලතල.

6. අධිකාරියේ අරමුණු නිසි පරිදි ඉටු කිරීම සඳහා අධිකාරිය විසින් පහත සඳහන් බලතල අතුරින් කිසිවක් හෝ ඊට වැඩි ගණනක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :–

(අ) අත්කර ගැනීම, අධිග්‍රහණය, සතු කිරීම, ප්‍රදානය කිරීම හෝ මිල දී ගැනීම මගින් යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම නැතහොත් එවැනි දේපළක් ත්‍යාගයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම හෝ එවැනි දේපළක් දැරීම, කළමනාකරණය කිරීම, විකිණීම, භාරදීම, හුවමාරු කිරීම, බද්දට දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) දේශීය හෝ විදේශීය යම් ප්‍රභවයකින් ත්‍යාග සහ පරිත්‍යාග ලබා ගැනීම ;

(ඇ) කර්තව්‍ය ඉටුකිරීමේ දී අධිකාරියට අවශ්‍ය වන මුදල් ණයට ගැනීම ;

(ඈ) අධිකාරිය විසින් කුලියට දී ඇති යම් ඉඩම් කොටසක් හෝ ගොඩනැගිලි හෝ සහාධිපත්‍ය දේපළ සඳහා කුලිය අය කිරීම ;

(ඉ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරිය විසින් ඉටුකරනු ලබන යම් සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් අය කිරීම ;

(ඊ) සහාධිපත්‍ය කොටස්වලට අයිතිකරුවන්ට ඇති සම්බන්ධතාවට සමානුපාතිකව ඔවුන්ගෙන් වාරික මුදල් අය කර ගැනීම ;

(උ) සහාධිපත්‍ය දේපළ කොටස්වල පොදු පහසුකම්වලට හෝ පොදු අංගෝපාංග වලට අයිතිකරු ඇතුළු යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් හානියක් යථා තත්ත්වයට ගෙන ඒමෙහි ලා දරන ලද වියදම් අයිතිකරුවන්ගෙන් හෝ ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම ;

(ඌ) යම් සහාධිපත්‍ය දේපළ කොටසක කළමනාකරණ සංස්ථාවේ හෝ එහි අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ ඉල්ලීම පිට ඒ දේපළ කොටස පිළිසකර කිරීම, අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම ඇතුළු සේවා ඒ සහාධිපත්‍ය දේපළ කොටසට සැපයීම සහ ඒ සඳහා ගාස්තු අය කර ගැනීම ;

(එ) ඉදිකිරීම් කටයුතු භාරගැනීම ;

(ඒ) වෙනත් සහාධිපත්‍ය දේපළ කොටස් හෝ පොදු අංගෝපාංගවලට ද සේවා සපයන නළ, රැහැන්, කේබල් සහ ප්‍රණාල පරීක්ෂා කිරීම, අලුත්වැඩියා කිරීම හෝ අලුත් කිරීමේ කාර්යය සඳහා හෝ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටස් හෝ පොදු පහසුකම් හෝ පොදු අංගෝපාංග නඩත්තු කිරීමේ, අලුත් කිරීමේ, පිළිසකර කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කාර්ය සඳහා හෝ සහාධිපත්‍ය දේපළේ නැතහොත් අර්ධ සහාධිපත්‍ය දේපළේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ හෝ කඩා බිඳ දැමීමේ කාර්යය සඳහා නැතහොත් මේ වගන්තියේ සඳහන් බලතල අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීමේ දී අදාළ යම් ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව ක්‍රියා කරන බවට සහතික වීමේ කාර්ය සඳහා අධිකාරිය

විසින් ම හෝ එහි නිසි පරිදි බලය පවරන ලද නියෝජිතයන් විසින් සියලු සාධාරණ වේලාවන්හි දී යම් සහාධිපත්‍ය දේපළකට ඇතුළුවීම ;

(ඔ) ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය පිඹුරෙහි දක්වා ඇති ගොඩනැගිලි ඉදිකිරීම පරීක්ෂා කිරීමේ සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමේ කාර්ය සඳහා තාවකාලික සහාධිපත්‍ය දේපළෙහි යම් කොටසකට සියලු සාධාරණ අවස්ථාවන්හි දී අධිකාරිය හෝ නිසි පරිදි බලය පවරන ලද නියෝජිතයන් ඇතුළුවීම ;

(ඕ) අධිකාරියේ අරමුණුවලින් යම් අරමුණක් ඉටු කිරීමේ කාර්යය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට ඇතුළුවීම සහ වැඩ පිළිවෙලවල් සකස් කිරීම ;

(ක) සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ හෝ ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාව සහ එහි අයිතිකරු අතර හෝ අයිතිකරු සහ පදිංචිකරු අතර, හෝ අයිතිකරු සහ මිල දී ගත් තැනැත්තා අතර හෝ අයිතිකරු සහ උකස්කරු අතර හෝ උකස්කරු සහ මිල දී ගැනීමට අදහස් කරන තැනැත්තා අතර හෝ උකස්කරු සහ උකස් ලාභියා අතර හෝ ඇතිවන ආරාවුල් විසඳීම ;

(ග) අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරවීම සහ එහි නිලධරයන් සහ සේවකයන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කරවීම ;

(ච) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සඳහා රීති සෑදීම ; සහ

(ජ) අධිකාරියේ අරමුණු නිසි ලෙස ඉටු කර ගැනීමට හැකිවන පරිදි අධිකාරියේ මතය අනුව අවශ්‍ය විය හැකි සියලුම දේ ඉටුකිරීම.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සභාධිපත්‍ය දේපළෙහි පොදු පහසුකම්වල සහ පොදු අංගෝපාංගවල පාලනය, නඩත්තුව ආදිය අධිකාරිය විසින් භාරගත යුතු බව.

7. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා විසින් කරනු ලබන විධානයක් මත හෝ සභාධිපත්‍ය කොටස් සියල්ලේම අයිතිකරුවකු හෝ අයිතිකරුවන් විසින් කරනු ලබන ඉල්ලීමක් මත හෝ කළමනාකරණ සංස්ථාව විසින් කරනු ලබන ඉල්ලීමක් මත හෝ පළාත් පාලන ආයතන හෝ වෙනත් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත සහ සභාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි සභාධිපත්‍ය කොටස්වල පොදු පහසුකම් හෝ පොදු අංගෝපාංග නිසි පරිදි පාලනය කිරීමේ, නඩත්තු කිරීමේ, කළමනාකරණය කිරීමේ හා පරිපාලනය කිරීමේ හැකියාව එකී අයිතිකරුට හෝ අයිතිකරුවන්ට නැතහොත් කළමනාකරණ සංස්ථාවට නොමැති බවට අධිකාරිය සෑහීමට පත්වුවහොත් සභාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් පාලනය කිරීමට, නඩත්තු කිරීමට, කළමනාකරණය කිරීමට සහ පරිපාලනය කිරීමට කළමනාකරණ සංස්ථාවට හැකි වන තුරු අධිකාරිය විසින් එකී පොදු අංගෝපාංග වල සහ පොදු පහසුකම්වල පාලනය, නඩත්තුව, කළමනාකරණය සහ පරිපාලනය භාර ගත යුතු ය."

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"කළමනාකරණ මණ්ඩලය.

8. (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා (මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන)

කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, ඒ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :–

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන් එනම් :–

(i) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iii) 2002 අංක 44 දරන මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iv) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා ;

(v) පිළිවෙලින් කොළඹ, කෝට්ටේ, දෙහිවල ගල්කිස්ස සහ මොරටුව මහනගර සභාවල නාගරික කොමසාරිස්වරු ;

(vi) මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු 17 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලැබූ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා ;

(ආ) අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන ආකාරයට පත් කරනු ලබන තැනැත්තන් හය දෙනකු ; (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන)

(i) මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිතයකු ;

(ii) නිවාස උකස් ණයට දෙන්නන්ගේ සංගමයේ නියෝජිතයකු ;

(iii) පෞද්ගලික අංශයේ සංවර්ධකයන්ගේ සංගමයේ නියෝජිතයකු ;

(iv) කළමනාකරණ සංස්ථාවේ සාමාජිකයකු ;

(v) ලංකා වාණිජ මණ්ඩලයේ නියෝජිතයකු ;

(vi) සභාපතිවරයා විය යුතු සභාධිපත්‍ය දේපළ කළමනාකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති තැනැත්තකු

(2) යම් තැනැත්තෙක්-

(අ) පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත් ;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම අවසන් වුවහොත්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ දිගටම කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(3) (5) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව පත් කළ සාමාජිකයන් අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර ඔවුන් නැවත පත් කිරීම සඳහා සුදුස්සන් විය යුතු ය.

(4) සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු-

(අ) (2) වන උපවගන්තියෙහි දැක්වෙන නුසුදුසුකම්වලට යටත් වුවහොත් ;

(ආ) ශාරීරික දුබලතාවක් හෝ මානසික ආබාධයක් නිසා ස්වකීය කාර්ය ඉටුකිරීමට අපොහොසත් වුවහොත් ; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ මතය අනුව අධිකාරිය අපකීර්තියට භාජනය විය හැකි යම් ක්‍රියාවක් සිදුකළහොත්,

ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලයේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු ධුරය අත්හැර යෑමේ දී, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරි ධුර කාලය ඇතුළත ධුර දැරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තම කාර්ය ඉටු කිරීමට සභාපතිවරයාට හෝ යම් පත් කළ සාමාජිකයකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක අමාත්‍යවරයා විසින් සභාපතිවරයා හෝ සාමාජිකයා වෙනුවට වැඩබැලීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතමින් යවන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක දී ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණයන් අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් මණ්ඩලයේ සියලු රැස්වීම්වල දී මුලසුන දැරිය යුතු අතර, එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණිවිට රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයන් විසින් එක් සාමාජිකයකු තෝරා පත්කර ගත යුතු ය.

(10) නොවැළැක්විය හැකි හේතුවක් නිසා නිලබලයෙන් පත් වූ සාමාජිකයකුට යම් රැස්වීමකට පැමිණිය නොහැකි නම්, දෙන ලද දිනයක දී පැවැත්වීමට නියමිත මණ්ඩලයේ රැස්වීමක දී තමා නියෝජනය කිරීම සඳහා කවර හෝ අවස්ථාවක දී ලිඛිත පූර්ව දැන්වීමක් මගින් තම නියෝජ්‍ය නිලධරයා නම් කරනු ලැබිය හැකි ය.

(11) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු අතර, මණ්ඩලයේ ප් රැස්වීම් සහ ප් රැස්වීම්වල දී කටයුතු ඉටුකිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(12) මේ නීතිය යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය, අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

(13) මණ්ඩලය විසින් ඉටුකරන ලද යම් කටයුත්තක් හෝ ඉටු කිරීමට යෝජිත යම් කටයුත්තක් පිළිබඳව සෘජුවම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධතාවක් ඇති මණ්ඩලයේ සාමාජිකයකු විසින් ඒ කරුණ පිළිබඳව මණ්ඩලයේ රැස්වීමක දී

සාකච්ඡා කරන අවස්ථාවක දී, ඒ සම්බන්ධතාවෙහි ස්වභාවය හෙළිකළ යුතු ය. එසේ හෙළිකිරීම මණ්ඩලයේ රැස්වීම් වාර්තාවල වාර්තාගත කළ යුතු අතර, ඒ කටයුත්ත පිළිබඳව මණ්ඩලය විසින් කටයුතු කිරීමේ දී හෝ තීරණය කිරීමේ දී ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු අතර එසේ කටයුතු කරන අවස්ථාවේ දී හෝ තීරණය ගනු ලබන අවස්ථාවේ දී ඒ සාමාජිකයා රැස්වීමෙන් ඉවත්ව යා යුතු ය.

(14) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත්කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"කළමනාකරණ සංස්ථාවේ කටයුතු පිළිබඳව පරීක්ෂා කිරීම.

9. (1) අධිකාරිය විසින්, සිය කැමැත්තෙන් ම හෝ කළමනාකරණ සංස්ථාවේ සාමාජිකයන් වැඩි දෙනකුගේ ඉල්ලීම මත හෝ සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක ඉල්ලීම මත කළමනාකරණ සංස්ථාවේ කටයුතු පිළිබඳව සහ මූල්‍ය ස්ථාවරභාවය පිළිබඳව පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ය : නැතහොත් තත්කාර්ය සඳහා ලිඛිතව කරනු ලබන නියමයක් මගින් එවැනි පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අධිකාරිය විසින් බලය පවරන ලද තැනැත්තකුට විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ පරීක්ෂණයක කාර්ය සඳහා අධිකාරියට හෝ පරීක්ෂණයක් පැවැත්වීමට එය විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට -

(අ) කළමනාකරණ සංස්ථාවේ යම් සාමාජිකයකු හෝ සහාධිපත්‍ය කොටස්වල අයිතිකරු හෝ අයිතිකරුවන් කැඳවීමට ;

(ආ) කළමනාකරණ සංස්ථාවේ කටයුතුවලට හෝ යම් මුදල් හෝ ඇපවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට :

(ඇ) සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට ;

(ඈ) කළමනාකරණ සංස්ථාවේ ගිණුම් පොත් හෝ ලේඛන ස්වකීය භාරයට ගැනීමට,

බලය තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් අධිකාරිය විසින් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට අධිකාරිය විසින් බලය පවරනු ලැබූ තැනැත්තා විසින් කරනු ලැබූ අවස්ථාවක තිසි පරීක්ෂණයකින් පසුව කළමණාකාර සංස්ථාව පිළිබඳව නියමයක් කළ යුතු අතර පරීක්ෂණයේ නියමය සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටස්වල සියලුම අයිතිකරුවන්ට දැනුම් දිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයන් පිළිපැදීම කළමනාකරණ සංස්ථාවේ කාර්යය විය යුතු ය.''.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ, 9ආ, 9ඇ සහ 9ඈ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :- ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ, 9ආ, 9ඇ සහ 9ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"අනවසර ඉදිකිරීම් කඩා බිඳ දැමීම.

9අ. (1) ලියාපදිංචි හෝ ලියාපදිංචි නොකළ යම් සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් තුළ අනවසර ඉදිකිරීම් ගොඩනගා ඇති බවට හෝ ගොඩනගමින් පවතින බවට අධිකාරියට පැමිණිල්ලක් ලැබුන අවස්ථාවක හෝ තොරතුරක් ලැබුන අවස්ථාවක අධිකාරිය විසින් සහාධිපත්‍ය කොටසේ අයිතිකරු වෙත ලිඛිත දැන්වීමක් යැවීමට සැලැස්විය යුතු අතර, සහාධිපත්‍ය කොටස තුළ එවැනි අනවසර ඉදිකිරීම් හෝ පොදු අංගෝපාංග ඉදිකරන හෝ ඉදිකරනු ලැබ ඇති ඒ සහාධිපත්‍ය

කොටසේ අයිතිකරු සහ කළමනාකරණ සංස්ථාවක් ඇත්නම් ඒ කළමනාකරණ සංස්ථාව වෙත ඒ දැන්වීමෙන් එක් පිටපත බැගින් යවනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඒ අයිතිකරුට, පදිංචිකරුට හෝ කළමනාකරණ සංස්ථාවට ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති දිනය, වේලාව සහ ස්ථානය අනුව විභාගයක් සඳහා පෙනී සිටීමට සහ

(අ) ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු කරගෙන යාම අධිකාරිය විසින් තහනම් නොකළ යුත්තේ මන්ද ;

(ආ) අනවසර ඉදි කිරීම් කඩා බිඳ නොදැමිය යුත්තේ මන්ද සහ සහාධිපත්‍ය කොටස එහි මුල් ස්වභාවයට ප්‍රතිෂ්ඨාපනය නොකළ යුත්තේ මන්ද,

යන්නට හේතු දැක්වීමට විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ දැන්වීමක් ලැබීමෙන් පසුව එළඹෙන විභාගයේ දී පෙනී සිටින තැනැත්තන්ට හේතු දැක්වීමේ අවස්ථාවක් ලබා දිය යුතු අතර, ඉන්පසුව ඒ ඉදිකිරීම අනවසර ඉදිකිරීමක් වන්නේ යයි අධිකාරියේ මතය වන අවස්ථාවක අධිකාරිය විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ කළමනාකරණ සංස්ථාවට නැතහොත් වෙනත් තැනැත්තකුට,

(අ) එවැනි අනවසර ඉදිකිරීම් කටයුතු කරගෙන යාමෙන් වැළකීමට ; හෝ

(ආ) සහාධිපත්‍ය කොටසක් හෝ සහාධිපත්‍ය කොටසකට අනුබද්ධ සහායක කොටසක් හෝ පොදු අංගෝපාංග ඒවායේ මුල් ස්වභාවයට පුනස්ථාපනය කිරීමට ; හෝ

(ඇ) ඉදිකරනු ලැබ ඇති සහාධිපත්‍ය දේපළට හෝ අර්ධ සහාධිපත්‍ය දේපළට යටත් වූ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට එකඟවීමේ කාර්ය සඳහා වෙනත් යම් පියවර ගැනීමට,

විධානය කරනු ලැබිය හැකි ය.

(3) ඒ අයිතිකරු හෝ පදිංචිකරු හෝ කළමනාකරණ සංස්ථාව හෝ වෙනත් තැනැත්තා අවස්ථාවෝචිත පරිදි-

(අ) විභාගයට පෙනී සිටීම පැහැර හරින අවස්ථාවක දී ;

(ආ) එකී විභාගයට පෙනී සිටීමෙන් පසු (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන යම් විධානයක දී ඒ විධානය නිකුත් කරන දින සිට දින හතක් ඇතුළත එයට අනුකූලවීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී,

අධිකාරිය විසින්-

(i) එකී අනවසර ඉදිකිරීම් කඩා බිඳ දැමීමට සුදුසු පියවර ගැනීම ;

(ii) ඉඩම් කොටස හෝ ගොඩනැගිල්ල භාවිත කිරීම නතර කිරීමට විධාන කිරීම ;

(iii) අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙනත් තැනැත්තකු සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ වූ එවැනි විධානයක් මගින් සිදුකිරීමට නියම කරන ලද වෙනත් යම් සියලු ක්‍රියාවන් සිදුකිරීම,

කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරිය විසින් (3) වන උපවගන්තියේ (i) වන, (ii) වන සහ (iii) වන ඡේද යටතේ ක්‍රියාකිරීමේ කාර්ය සඳහා ඒ අනවසර ඉදිකිරීම් ඉදිවෙමින් පවත්නා හෝ ඒ අනවසර ඉදිකිරීම් ඉදිකරන ලද සභාධිපත්‍ය දේපළට හෝ අර්ධ සභාධිපත්‍ය දේපළට ඇතුළුවීමට සහ ඒ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු කටයුතු කිරීම සඳහා කිසියම් නිලධරයකුට බලය දෙනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තියෙන් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම තුළින් යම් ක්‍රියාවක් සිදුකරන යම් තැනැත්තකුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් හෝ වෙනත් යම් නීති කෘත්‍යයක් පවරනු නොලැබිය යුතු අතර, එවැනි ක්‍රියාවක් හේතුවෙන් සිදුකරන ලද යම් අලාභයක් හෝ පාඩුව සඳහා කිසි ම වන්දි මුදලකට කිසිදු අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු හෝ තැනැත්තකු හිමිකම් නොලැබිය යුතු ය.

(6) (3) වන උපවගන්තියේ (i) වන, (ii) වන හෝ (iii) වන ඡේද යටතේ වූ පියවර ගැනීමේ කාර්යය සඳහා අධිකාරියට අවශ්‍ය සියලුම සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට, එසේ සහාය ලබාදීම පොලිසියේ සෑම සාමාජිකයකුගේ ම කාර්ය විය යුතු ය.

(7) (4) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක වූ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ දී, කඩා බිඳ දැමීමේ දී හෝ භාවිතය නතර කිරීම සඳහා වූ යම් වැඩක් සිදුකිරීමේ දී අධිකාරිය විසින් දරන ලද සියලු සාධාරණ වියදම් ආපසු ලබා ගැනීමට හිමිකම අධිකාරියට තිබිය යුතු ය.

(8) ඒ අයිතිකරු හෝ පදිංචිකරු හෝ ඒ තැනැත්තා එකී දැන්වීමට අනුකූලවීමට අපොහොසත් වීම හේතුවෙන් ම ඔහු විසින් දරන ලද යම් වගකීමකට මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන බල නොපැවැත්විය යුතු ය.

ලියාපදිංචි අයිතිකරුවකු විසින් සපයන ලද පොදු පහසුකම් සම්බන්ධයෙන් ගැනුම්කරුවකු විසින් කරන පැමිණිලි.

9ආ. (1) ගොඩනැගිලි පිඹුරු අනුමත කිරීමට බලය පවරනු ලැබ ඇති අධිකාරිය විසින් නියත කළ සහාධිපත්‍ය දේපළේ ලියාපදිංචි අයිතිකරු විසින් ඒ සහාධිපත්‍ය කොටසට සපයන ලද පොදු පහසුකම්වල ප්‍රමිතියට අදාළ අනුකූලතා සහතිකයක් නොමැතිව වුව ද, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබ ඇති සහාධිපත්‍ය දේපළක සහාධිපත්‍ය කොටසක ගැනුම්කරුවකු විසින් කරන ලද ලිඛිත පැමිණිල්ලක් මත අධිකාරිය විසින් නිසි පරිදි විභාගයක් පැවැත්වීමෙන් පසුව ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති කාලයක් ඇතුළත අධිකාරිය සෑහීමකට පත්වන ආකාරයෙන් අවශ්‍ය කරන පොදු පහසුකම් ලියාපදිංචි අයිතිකරුගේ වියදමින් සැපයීමට ලියාපදිංචි අයිතිකරුට විධානය කරමින් නියෝග කළ හැකි ය.

(2) ලියාපදිංචි අයිතිකරුවකුට එරෙහිව (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් කරනු ලැබූ විටෙක ඒ නියෝගයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින අවස්ථාවක දී, අධිකාරිය විසින් ඒ සේවාව ඒ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටසේ ගැනුම්කරුට සැපයිය යුතු අතර එකී ලියාපදිංචි අයිතිකරුගෙන් අයවිය යුතු ණයක් ලෙස නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක පවරනු ලබන නඩු කටයුත්තකින් ලියාපදිංචි අයිතිකරුගෙන් ඒ වියදම අයකරගත යුතු ය.

ලියාපදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරක දක්වා ඇති ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රගතිය පිළිබඳ නියාමනය කිරීම.

9ඇ. (1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් තාවකාලික සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමෙන් පසු, තාවකාලික සභාධිපත්‍ය පිඹුර සමග ගොනුකළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව ලියාපදිංචි තාවකාලික සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති ඉදිකළ යුතු ගොඩනැගිලිවල ඉදිකිරීමේ ප්‍රගතිය දක්වමින් ත්‍රෛමාසික වාර්තාවක් පිටපත් තුනකින් යුක්තව, එක් පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙතත්, අනෙක් පිටපත සාමාන්‍යාධිකාරිවරයා වෙතත්, ඉතිරි පිටපත උකස් හිමියෙක් වේ නම් ඔහුටත් ලබාදිය යුතු ය.

(2) 1 වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව සකස් කරන ලද ප්‍රගති වාර්තාවක්, ත්‍රෛමාසිකව භාර දෙනු ලැබිය යුතු ය.

(3) තාවකාලික සභාධිපත්‍ය පිඹුරක් සමග ගොනුකරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව ලියාපදිංචි තාවකාලික සභාධිපත්‍ය දේපළක ඉදිකිරීමේ කටයුතු සිදුකරගෙන නොයන බවට පිළිගතහැකි පරිදි සාමාන්‍යාධිකාරිවරයා සෑහීමකට පත්වන අවස්ථාවක සහ උකස්හිමියන් හෝ සුරක්ෂිත උකස්කරයක් යටතේ හිමිකම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා විසින් හිමිකම් ලියාපදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරක දැක්වෙන ආකාරයට ඉඩම් කොටසක යෝජිත ගොඩනැගිලි ඉදි කරනු ලැබීම සඳහා අයිතිකරුට දැනටමත් මුදල් සපයා ඇති හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හිමිකම ලියාපදිංචි කරන ලද විකිණීම සඳහා වූ ගිවිසුමක් යටතේ තාවකාලික සභාධිපත්‍ය කොටසක් මිල දී ගැනීමට එකඟ වෙමින් අයිතිකරුට අත්තිකාරම් මුදලක් ලෙස මුදල් සපයා ඇති ලියාපදිංචි වූ අනාගත ගැනුම්කරුවන් සම්බන්ධයෙන් ආරක්ෂාව ලබාදීම පිණිස අධිකාරියේ මැදිහත්වීම අවශ්‍ය යයි ඔහුගේ මතය වන අවස්ථාවක, සාමාන්‍යාධිකාරිවරයා විසින් යථා පරිදි දැනුම්දීමකින් පසු අයිතිකරු, උකස්හිමියන්, වේ නම් ඔවුන් ද සහ අනාගත ගැනුම්කරුවන් ද වේ නම් ඔවුන්ගේ රැස්වීමක් කැඳවිය යුතු අතර සතුටුදායක ලෙසින් ඒ ඉදිකිරීම් කරගෙන යාමට අයිතිකරුට බාධාවක් වන්නා වූ ප්‍රශ්න නිසි ආකාරයෙන් හඳුනාගෙන සාකච්ඡා කළ යුතු ය.

(4) අයිතිකරු ඒ රැස්වීමට සහභාගිවීමට අපොහොසත් වන අවස්ථාවක දී හෝ සහභාගි වුවද එසේ ප්‍රමාද වීම පිළිබඳව සෑහිමට පත්විය හැකි කරුණු ඉදිරිපත් කිරිමට අපොහොසත් වේ නම් හෝ යෝජිත ගොඩනැගිල්ල අර්ධ වශයෙන් නිම කළ ගොඩනැගිල්ලක මට්ටමකට ඉදිකිරිම සඳහා සකස් කරන ලද පිළිගත හැකි වැඩ ලේඛනයක් ලබා දීමට අපොහොසත් වේ නම්, එවැනි ඉඩම් කොටසක් සහ කේවල සහාධිපත්‍ය කොටසක් සුරක්ෂිත කරමින් පවතින සියලු උකස්කර නිදහස් කළ හැකි අතර, ලියාපදිංචි වී ඇති අනාගත ගැනුම්කරුවන් වෙනුවෙන් කරන ලද සියලු බැඳීම්වලින් කරනු ලැබිය හැකි සියලු වගකීම් වලින් නිරවුල් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින්-

(අ) උකස් හිමියන්ට අයවිය යුතු මුදල් නැවත අයකර ගැනීමට සහ ඉඩම් කොටස විකිණීමෙන් පසුව උකස් හිමියා වෙත වැඩිපුර මුදලක් ඉතිරි වී ඇත්නම් ලියාපදිංචි වන ලද අනාගත ගැනුම්කරුවන්ගේ හිමිකම් නිරවුල් කිරීමට හා උකස් ඔප්පුවට අනුව පියවර ගැනීම සඳහා උකස් හිමියන්ට නිර්දේශ කිරිම ;

(ආ) ලියාපදිංචි උකස් හිමියන් හෝ ලියාපදිංචි වන ලද අනාගත ගැනුම්කරුවන්ගේ ගෙවීම් බේරුම් කිරිම පිණිස තාවකාලික සහාධිපත්‍ය දේපළ ඉදි කරනු ලැබිය යුතු ඉඩම් කොටස අධිකාරියට පැවරිම සඳහා අමාත්‍යවරයාට නිර්දේශ කිරිම.

පැහැර හරිනලද අයිතිකරුවකු ගේ ඉඩම් කොටස පැවරිම.

9ඇ. පටහැනිව මේ නීතියේ හෝ වෙනත් යම් නිතියක කුමක් සඳහන් වුව ද,-

(අ) අමාත්‍යවරයා විසින්, අධිකාරිය මගින් කරනු ලබන නිර්දේශයක් මත හෝ උකස් හිමියාගේ ඉල්ලීම මත පවත්වනු ලබන විභාගයකින් පසු සෑහිමට පත්වන අවස්ථාවක දී ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය පිඹුරට අනුව ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට අයිතිකරුට විධානය කරමින් නියෝග කළ යුතු ය.

(ආ) ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය දේපළේ අයිතිකරුට ඒ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට විධානය කරමින් (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියෝගයක් කරන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ඒ නියෝගයෙහි-

(i) ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ තාවකාලික සහාධිපත්‍ය කොටස් සංඛ්‍යාව අර්ධ සහාධිපත්‍ය දේපළක් ලෙස තීරණය කරනු ලැබිය හැකි පරිදි ඉදි කරනු ලැබිය යුතු බව ;

(ii) ඒ ඉදි කිරීම් නිම කිරීමට අවශ්‍ය වන්නේ කවර කාලයක් ඇතුළත දී ද යන බව ;

(iii) අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අවසාන දිනය,

නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(ඇ) (මෙහි මින් මතු පැහැර හරින ලද අයිතිකරු වශයෙන් සඳහන් කරනු ලබන) යම් තාවකාලික සහාධිපත්‍ය දේපළක අයිතිකරු, (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගයක් සම්බන්ධයෙන් ඒ නියෝගයට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයක් මගින් ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති ඒ ඉඩම් කොටස අධිකාරියට පවරනු ලැබිය යුතු ය.

(ඈ) (3) උපවගන්තිය යටතේ තාවකාලික සහාධිපත්‍ය දේපළක ඉඩම් කොටසක් අධිකාරිය වෙත පවරනු ලැබ ඇති අවස්ථාවක, එකී ඉඩම් කොටස පැහැර හරින ලද අයිතිකරු තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ දිනයට ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ලබන වටිනාකම මත වූ යම් වන්දියකට හිමිකම් ලබන අතර ඒ වන්දිය, පැහැර හරින ලද අයිතිකරුගේ පහත සඳහන් ණයවලට එරෙහිව හිලව් කළ යුතු ය.

(i) උකස් කිරීමකින් හෝ අත්පත්සාරගත් දේපළක් උකස් කිරීමෙන් උද්ගතවන හිඟ ණය මුදලක් ;

(ii) තාවකාලික සහාධිපත්‍ය කොටස් විකිණීම් සඳහා වූ ගිවිසුම්වලින් උද්ගතවන හිඟ ණය මුදලක් ;

(iii) ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය දේපළකට අදාළව රජයේ යම් ආයතනයකට ගෙවිය යුතු හිඟ ණය මුදලක්,

(ඉ) ඉහත සඳහන් කළ කිසිදු පාර්ශ්වයකට බේරුම් නොකර යම් මුදලක් ඉතිරිව ඇති අවස්ථාවක දී ඒ බේරුම් නොකරන ලද මුදල පැහැර හරින ලද අයිතිකරුගෙන් ලැබිය යුතු ණය මුදලක් අයකර ගන්නා ආකාරයෙන් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක නඩු කටයුත්තක් මාර්ගයෙන් අධිකාරිය විසින් ආපසු අයකර ගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්පත් කර ගැනීම.

10. (1) අධිකාරියේ යම් විශේෂිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්පත් කර ගැනීම අවශ්‍ය වන්නා වූ ද සහ ඒ දේපළ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ කාර්යය සඳහා යෝජිත අත්පත් කර ගැනීම අනුමත කරන අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය දේපළක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එය ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගෙන අධිකාරියට පවරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගන්නා යම් නිශ්චල දේපළක් සඳහා ගෙවිය යුතු යම් මුදලක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ, 10ආ සහ 10ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ, 10ආ සහ 10ඇ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :-

"වංචල සහ නිශ්චල යන දෙයාකාරයේ ම රජයේ දේපළ අධිකාරියට ලබා ගත හැකි බව.

10අ. (1) අධිකාරියේ යම් කාර්යයන් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ කාර්ය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කරනු ලැබිය හැකි ඒ දේපළේ විශේෂ ප්‍රදානය කිරීමක් හෝ බදු දීමක් විය හැකි කාර්යයන් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව අධිකාරිය ඒ දේපළ විශේෂ ප්‍රදානය කිරීමක දී හෝ බදු දීමක දී ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ කර ගත යුතු ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා රජයේ යම් වංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය හැකි නියමයක් මගින් ඒ වංචල දේපළේ සන්තකය හා භාවිතය අධිකාරියට ලබා දීම සහ පැවරීම කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද ඒ වංචල දේපළෙහි පාලනය භාරව සිටින අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස මේ උපවගන්තියේ පූර්වයෙන් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් රජයේ යම් වංචල දේපළක් සඳහා බලපවත්වන කිසිඳු නියමයක් නොකළ යුතු ය.

(3) රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් භාර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මිස අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ රජයේ යම් දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක කිසියම් වංචල දේපළකට බලපාන කිසිඳු නියමයක් නොකළ යුතු ය.

සහාධිපත්‍ය සංවර්ධන ව්‍යාපෘති සඳහා සහාධිපත්‍ය දේපළ අත්පත් කර ගැනීම.

10ආ. (1) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සහාධිපත්‍ය ප්‍රතිසංවර්ධන අරමුණු කිසිවක් මුදුන් පමුනුවා ගැනීමේ කාර්ය සඳහා පහත දැක්වෙන කරුණුවලින් කිසිවක් සඳහන් කරන ලද යම් සහාධිපත්‍ය දේපළක්

හෝ යම් කොටසක් හෝ සහාධිපත්‍ය කොටසකින් කිසිවක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් අත්පත් කර ගැනීම අවශ්‍ය බව අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශ කළ හැකි ය :—

(අ) සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක දක්වා ඇති යම් නැවත බෙදනු ලැබූ ගොඩනැගිල්ලක් 1973 අංක 11 දරන ජාතික රාජ්‍ය සභාවේ බද්ධ නිවාස අයිතිකම් පනතේ 20ට වගන්තියට අනුකූලව සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ යෝජනා සම්මතයක් මගින් විනාශ කරනු ලැබිය යුතු යයි සම්මත කර තිබෙන අවස්ථාවක ; හෝ

(ආ) සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක දක්වා ඇති නැවත බෙදනු ලැබූ ගොඩනැගිල්ලකට හානි වී ඇතත් සම්පූර්ණයෙන් විනාශ වී නැති අවස්ථාවක සහ කළමනාකරණ සංස්ථාව හෝ අයිතිකරුවන් විසින් 1973 අංක 11 දරන ජාතික රාජ්‍ය සභාවේ බද්ධ නිවාස අයිතිකම් පනතේ 20ඩ වගන්තිය යටතේ නියම කරනු ලැබ ඇති පරිදි නැවත බෙදනු ලැබූ ගොඩනැගිල්ලේ හානි වූ කොටස ප්‍රතිස්ථාපනය කිරීම පැහැර හැර ඇති හෝ එය කිරීමට අපොහොසත් වී ඇති අවස්ථාවක ; හෝ

(ඇ) සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක දැක්වෙන නැවත බෙදනු ලැබූ ගොඩනැගිල්ලක් ප්‍රකාශනයට අවම වශයෙන් වසර හතළිහකටවත් (40) පූර්වයෙන් ඉදිකර ඇති අවස්ථාවක ; හෝ

(ඈ) සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක දක්වා ඇති නැවත බෙදනු ලැබූ ගොඩනැගිල්ලක සහ එහි පොදු

අංගෝපාංග නඩත්තු කිරීම් සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගෙන් බහුතරය විසින් හෝ කළමනාකරණ සංස්ථාව විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ හේතුවෙන් අසල්වැසියන්ට හිරිහැරයක් සිදුවන හෝ ප්‍රදේශයේ පරිසරයට බලපෑම් සිදුවන අවස්ථාවක.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අවස්ථාවක ඒ නිවේදනයේ අදාළ වන්නා වූ සහාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ කාර්ය සඳහා, ඒ පනත යටතේ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි ඉඩමක් ලෙස සලකා අත්පත් කර ගනු ලැබිය හැක.

ඉඩම්, මහල් නිවාස, නිවාස හෝ වෙනත් පදිංචි වාසස්ථාන අන්සතු කිරීමේ අයිතිවාසිකම.

10ඇ. (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි සහ පවරා දීමේ ඔප්පුවේ නිශ්චිතව සඳහන් කර ඇති යම් නියම සහ කොන්දේසිවලට යටත් ව අධිකාරිය මගින් පවත්වාගෙන යන යම් ඉඩමක්, මහල් නිවාසයක්, නිවාසයක් හෝ අනෙකුත් පදිංචි වාසස්ථානයක් විකිණීමෙන්, බද්දට දීමෙන්, කුලියට දීමෙන් හෝ කුලී සින්නක්කරයක් මාර්ගයෙන් පවරනු ලැබිය හැකි අතර විශේෂයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, ඒ ඔප්පුවේ නිශ්චිතව සඳහන් කර ඇති වෙනත් යම් කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී හෝ ඒ ඔප්පුව යටතේ අධිකාරියට ගෙවිය යුතු යම් මුදලක් එහි නිශ්චිතවම සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් කාලයක් සඳහා නොගෙවා ඉතිරිව පවතින අවස්ථාවක දී ඒ ඔප්පුව මගින් ඒ පවරාදීම බලාත්මක වීමට බලපාන කොන්දේසියක් අවලංගු කිරීම හෝ නිශ්චය කිරීම කළ හැකි ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා අධිකාරිය විසින් පවත්වාගෙන යන යම් රජයේ ඉඩමක් පවරාදීම බලාත්මක වීමේ දී රජයේ ඉඩම් ආඥාපනතේ කිසිවක් බලපැවැත්විය යුතු බව හෝ සැලකිය යුතු බව හෝ තේරුම් නොගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"සාමාන්‍යාධිකාරී වරයාගේ සහතිකය.

15. (1) යම් සහතිකයක නිශ්චිතව දක්වා ඇති තැනැත්තකුගෙන් අධිකාරියට යම් මුදලක් අයවිය යුතු බවට සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කළ එම සහතිකයේ දක්වා ඇති විටෙක සාමාන්‍යාධිකාරීවරයා විසින් හෝ ඒ වෙනුවෙන් ඔහු විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබ ඇතැයි දක්වා ඇත්නම් එය එහි ප්‍රකාශිත කරුණු බැලූ බැල්මට ඔප්පු වෙතැයි පෙනෙන සාක්ෂියක් විය යුතු අතර සාමාන්‍යාධිකාරීවරයාගේ හෝ තත්කාර්ය සඳහා ඔහු වෙනුවෙන් බලය දෙන ලද තැනැත්තකු ගේ අත්සන ඔප්පු කිරීමකින් තොරව ඒ කරුණු යම් අධිකරණයක දී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ, 15ආ සහ 15ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට පසු ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ, 15ආ සහ 15ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"අධිකාරියට අයවිය යුතු මුදල් ආපසු ලබාගැනීම.

15අ. (1) සහතිකයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තාගෙන් සඳහන් කර ඇති දිනයට අධිකාරියට අයවිය යුතු මුදල් ප්‍රකාශ කරමින් සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කරන සහතිකයක්, ඒ තැනැත්තා පදිංචි හෝ ඒ තැනැත්තාට අයිති යම් වංචල හෝ නිශ්චල දේපළක් පිහිටා ඇති දිස්ත්‍රික්කයේ අධිකරණ බලය පවතින

දිසා අධිකරණයක් ඉදිරිපිටට ඉදිරිපත් කිරීමෙන් පසු අධිකරණය විසින්, ඒ තැනැත්තාට, ඒ දේපළ චංචල දේපළක් නම් වෙනත් තැනක තැබීමෙන් හෝ ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සලස්වමින් හෝ ඉවත් කිරීමට අවසර දීම වළක්වමින් තහනම් ආඥාවක් නිකුත් කළ යුතු අතර පිස්කල්ට බලය පවරමින් ඒ මුදල ආපසු ලබා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඒ තැනැත්තාගේ චංචල සහ නිශ්චල දේපළ සියල්ල හෝ ඉන් කිසිවක් නැතහොත් එයින් යම් කොටසක් තහනමට ගෙන විකිණීමට නියම කරමින් ඇස්කිසි ආඥාවක් නිකුත් කිරීමට විධානය කළයුතු අතර, (101) වන අධිකාරිය වූ සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 226 වන සහ 297 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එවැනි තහනමකට ගැනීමක දී සහ විකිණීමක දී අදාළ කර ගත යුතු ය.

(2) සාමාන්‍යාධිකාරිවරයා විසින් (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සහතිකයක් නිකුත් කරන අවස්ථාවක දී ඔහු විසින් ඒ කාලය තුළ දී ම, පෞද්ගලිකව ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත්පණිවුඩ මාර්ගයෙන් ඒ පිළිබඳ වූ නිවේදනයක් සහතිකයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තැනැත්තාට ද නිකුත් කළ යුතු අතර ඒ තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම හේතුවෙන් මේ වගන්තිය යටතේ වන නීති කෘත්‍යයක් බල රහිත නොවිය යුතු ය.

යම් තැනැත්තකුගෙන් අධිකාරියට ලැබිය යුතු මුදල් ඒ තැනැත්තාගේ පාරිශ්‍රමික වලින් ලබාගැනීම.

15ආ. (1) මේ පනත යටතේ අධිකාරියට යම් මුදලක් ගෙවීමට බැඳී සිටින යම් තැනැත්තකු ශ්‍රී ලංකා රජයේ, පළාත් රාජ්‍ය සේවයේ, අධිකරණ සේවයේ හෝ කිසියම් සංස්ථාවක හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක සේවා නියුක්තියකු වන්නේ නම් ඒ සේවා නියුක්තයෙන් වූ ඔහුගේ පාරිශ්‍රමික වලින් එවැනි යම් මුදලක් ලබා ගැනීමට හෝ අඩුකර ගැනීමට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ලබා ගැනීමේ ක්‍රමය යම් තැනැත්තකු සම්බන්ධයෙන් සතුටුදායක ක්‍රමයක් බවට සාමාන්‍යාධිකාරිවරයාගේ

මතය වන අවස්ථාවක, ඔහු විසින් ඒ තැනැත්තාගේ සේවායෝජකයාට, ඒ තැනැත්තාට ගෙවනු ලැබිය හැකි පාරිශ්‍රමිකවලින් යම් මුදලක් යම් ආකාරයකින් අඩුකර විධානයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාල පරාසයක දී අධිකාරියට ගෙවීමට ලිඛිතව විධාන කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ විධානයක් ලබන සෑම සේවායෝජකයකු විසින් ම නොපමාව ඒ විධානයට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(4) යම් සේවා නියුක්තියකින් ලබන පාරිශ්‍රමිකයකින් එවැනි අඩු කිරීමක් කරන අවස්ථාවක දී, සේවායෝජකයා විසින් ලබාගැනීමේ දිනයෙන් දින දාහතරක් නොඉක්මවන සාධාරණ කාලයක් ඇතුළත දී, ගෙවීම කරනු ලබන තැනැත්තාගෙන් ඒ මුදල් හෝ ඒ ණය ආපසු ලබා ගැනීමේ දී එය භාරගත් බවට ඒ තැනැත්තාට කුවිතාන්සියක් නිකුත් කළයුතු අතර ඒ කාලය ඇතුළත දී ම ඒ සිද්ධිය සම්බන්ධයෙන් ඔහුට විධානය කළ සාමාන්‍යාධිකාරිවරයාට ද දැනුම් දිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ විධානයක් කරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ඔහුගේ සේවායෝජකයාගේ සේවා නියුක්තියෙන් ඉවත්ව යාමට හෝ ඉවත්ව යාමට ආසන්නව සිටින අවස්ථාවක දී සේවායෝජකයා විසින් නොපමාව—

(අ) ඒ තැනැත්තාට හිමි පාරිශ්‍රමිකය ඒ විධානය යටතේ අධිකාරියට ගෙවනු ලැබිය යුතු මුදල ඉක්මවන්නේ නම් ඒ පාරිශ්‍රමිකයෙන් එසේ අඩුකරගත් මුදල් අධිකාරියට ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) ඒ පාරිශ්‍රමිකය ගෙවිය යුතු මුදල නොඉක්මවන්නේ නම් ඒ මුළු පාරිශ්‍රමිකය ම අධිකාරියට ගෙවනු ලැබිය යුතු ය.

(6) යම් හැනැත්තකුගේ සේවායෝජකයකුට කිසියම් හේතුවක් නිසා (2) වන උපවගන්තිය යටතේ දෙන ලද විධානයකට යටත්වීමට නොහැකි වන අවස්ථාවක දී, ඔහු විසින්, එසේ කිරීමට ඔහුට ඇති නොහැකියාව සහ ඒ සඳහා වූ හේතු ලිඛිතව වහාම සාමාන්‍යාධිකාරීවරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධානවලින් කිසිවක් උල්ලංඝනය කරන සෑම සේවායෝජකයෙක් ම, වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(8) මේ වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධාන යටතේ වූ කිසියම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී–

(අ) පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වේ නම් ඒ සංස්ථාවේ සියලුම අධ්‍යක්ෂවරයන් සහ නිලධරයන් ; සහ

(ආ) පුද්ගල මණ්ඩලය ආයතනයක් වේ නම් ඒ ආයතනයේ සියලු කොටස්කරුවන්,

ඒ වැරදිවලට වරදකරුවන් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද, ඒ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ කොටස්කරුවකු විසින් ඔහුගේ දැනීමකින් තොරව ඒ වරද සිදුකරනු ලැබූ බවට හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා නියි උද්යෝගයෙන් ක්‍රියාකළ බවට හෝ ඔවුන් විසින් ඔප්පුකර සිටී නම් ඒ කිසිදු අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ කොටස්කරුවකු ඒ වැරදි සඳහා වරදකරුවකු වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

(9) අධිකාරියේ අනුමතය ඇතිව මේ වගන්තිය යටතේ වූ වරදක් සඳහා කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

(10) මේ පනත යටතේ අධිකාරියට ගෙවීමට බැඳී සිටින යම් මුදලක් ඒ සම්බන්ධයෙන් 2 වන උපවගන්තිය යටතේ සාමාන්‍යාධිකාරිවරයා දී ඇති විධානයක දී කිසියම් ආකාරයකින් හෝ තත්කාර්ය සඳහා අදාළ කරගත හැකි කවර හෝ නඩු කටයුත්තක් මාර්ගයෙන් ණය ආපසු ලබා ගැනීමට සාමාන්‍යාධිකාරිවරයාගේ අයිතිවාසිකම් බලාත්මක කිරීමේ දී මේ වගන්තියේ ඉහතින් වූ වගන්තිවල කිසිවකින් බලපෑමක් හෝ බලපෑමක් විය යුතු බවක් හෝ තේරුම් ගනු නොලැබිය යුතු ය.

සාමාන්‍යාධිකාරිවරයා විසින් අධිකාරිය වෙනුවෙන් වූ ලේඛන අත්සන් කිරීම.

15ඈ. මේ පනත යටතේ අධිකාරිය විසින් සාමාන්‍යාධිකාරිවරයාට පවරන ලද යම් බලතල, කර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ සිදු කිරීමේ දී ලියා අත්සන් කිරීමට අවශ්‍ය සියලු ලේඛන අධිකාරිය වෙනුවෙන් ලියා අත්සන් කිරීමට සාමාන්‍යාධිකාරිවරයාට බලය ඇත.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ :—

''(1) යම් සහාධිපත්‍ය කොටසක අයිතිකරුවකු සහ පදිංචිකරුවකු හෝ අයිතිකරුවකු සහ අයිතිකරුවකු හෝ කළමනාකරණ සංස්ථාව සහ අයිතිකරු හෝ අයිතිකරු නැතහොත් උකස්හිමියා සහ අයිතිකරු අතර හෝ උකස්හිමියා සහ උකස්හිමියා හෝ අයිතිකරු සහ ගැනුම්කරු හෝ අයිතිකරු සහ විය හැකි ගැනුම්කරු හෝ උකස්හිමියා සහ විය හැකි ගැනුම්කරු අතර එවැනි සහාධිපත්‍ය කොටසක් භාවිත කිරීමේ දී හෝ අත්කර ගැනීමේ දී හෝ එයට අනුබද්ධ පොදු පහසුකම් හෝ පොදු උපාංග භුක්ති විඳීමට යාමේ දී කිසියම් ආරාවුලක් උද්ගත වූ අවස්ථාවක දී ඒ ආරාවුල පිළිබඳ ඒ තැනැත්තා හෝ කළමනාකරණ

සංස්ථාව විසින් අධිකාරියට දැනුම් දිය යුතු අතර, අධිකාරිය විසින් නිසි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු යුක්තිසහගත හා සාධාරණ විය හැකි යයි අධිකාරියට පෙනී යා හැකි පරිදි ඒ ආරාවුල සම්බන්ධයෙන් යම් නියෝගයක් කරනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා.

17. (1) අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, සාමාන්‍යාධිකාරිවරයකු පත් කරනු ලැබිය හැකි අතර ඔහු ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) අධිකාරිය විසින් කවර හෝ අවස්ථාවක දී අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, (තත් කාර්ය සඳහා හේතු දක්වා) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සාමාන්‍යාධිකාරිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයාගේ සාමාන්‍ය අධීක්ෂණයට සහ පාලනයට යටත්ව සාමාන්‍යාධිකාරිවරයා අධිකාරියේ ව්‍යාපාර කටයුතු පිළිබඳව විධාන කිරීම ද අධිකාරියේ සංවිධානය සහ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම ද, එසේම අධිකාරියේ සේවා නියුක්තයන්ගේ පරිපාලනමය කටයුතු ද භාරව සිටිය යුතු ය.

(4) අධිකාරියේ අනුමතය ඇතිව සාමාන්‍යාධිකාරිවරයා විසින් ඔහුගේ බලතල කර්තව්‍ය හෝ කාර්යවලින් කිසිවක් ඔහු විසින් අවශ්‍ය යයි වරින් වර සලකනු ලබන අවස්ථාවන්හි දී අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකු වෙත ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, එසේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය පවරනු ලැබුවේ යම් සේවා නියුක්තයකු වෙත ද ඒ සේවා නියුක්තයා විසින්, සාමාන්‍යාධිකාරිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව එම බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සිදු කළ යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 17අ වගන්තිය ඇතුළත් කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය, ඒ ප්‍රඥප්තියේ 17අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :–

"නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

17අ. (1) අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන යම් නිලධරයන් සහ සේවකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන්ට සහ සේවකයන්ට අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින්, තීරණය කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ එවැනි අනුප්‍රමාණ අනුව, පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර ඔවුන් එම රීති මගින් තීරණය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

(3) අධිකාරියේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, අවස්ථාවෝචිත පරිදි, අධිකාරියේ කාර්ය මණ්ඩලයට එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලයක් සඳහා තාවකාලික වශයෙන් පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ යම් අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික

ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරවනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරිය යටතේ සේවය කරන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ වගකීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) අධිකාරියේ ඉල්ලීම පිට පළාත් රාජ්‍ය සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් සේවකයකු හෝ නිලධරයකු අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් රාජ්‍ය සේවා කොමසාරිස්වරයාගේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව සහ එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය නැතහොත් අධිකාරිය සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පළාත් පාලන ආයතනය විසින් එකඟ විය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව නියම සහ කොන්දේසි මත එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) (4) වන උපවගන්තිය හෝ (7) උපවගන්තිය ප්‍රකාරව යම් තැනැත්තකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(2) අධිකාරියේ අරමුදලට පහත සඳහන් අරමුදල් බැර කරනු ලැබිය යුතු ය :-

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත කවර හෝ යම් මූලාශ්‍රයකින් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ; සහ

(ඈ) යම් රාජ්‍ය දෙපාර්තමේන්තුවකින්, රාජ්‍ය සංස්ථාවකින් හෝ වෙනත් ආයතනයකින් අධිකාරිය වෙත පවරනු ලබන සියලු මුදල්.".

(2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(2අ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 19අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 19අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

"අධිකාරියේ ණයට ගැනීමේ බලතල.

19අ. (1) අධිකාරිය විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව සහ එවැනි නියම

සහ කොන්දේසිවලට යටත්ව මේ පනත යටතේ අධිකාරියේ වගකීම් ඉටු කිරීම සඳහා හෝ ඒ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වන මුදල් අයිරා මගින් හෝ අන්‍යාකාරයකින් තාවකාලිකව ණයට ලබාගත හැකි ය :

එසේ වුව ද මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් ලබාගත් යම් තාවකාලික ණය මුදල් සම්බන්ධයෙන් ගෙවීමට හිඟ තිබිය හැකි මුදල්වල එකතුව කවර අවස්ථාවකදීවත් මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි මුදලකට වැඩි නොවිය යුතු ය.

(2) අධිකාරිය විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය සහ අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව (1) වන උපවගන්තිය යටතේ තාවකාලික ණය මගින් මුදල් ණයට ගැනීම හැර ණය පත්‍ර නිකුත් කිරීම මගින් මුදල් ණයට ගත හැකි අතර, එසේ සාදන ලද සහ නිකුත් කරන ලද ණය පත්‍ර මේ පනතේ "සහාධිපත්‍ය, කළමනාකරණ අධිකාරිය ණය පත්‍ර" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(3) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට අනුකූලව සහාධිපත්‍ය, කළමනාකරණ අධිකාරිය ණය පත්‍ර නිකුත් කිරීම, පැවරීම, ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, බේරා ගැනීම සහ අවලංගු කිරීම කළ යුතු ය.".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"රජයේ ඇපවීම. 20. (1) මේ පනත යටතේ නිකුත් කරන ලද ණය පත්‍ර මත අයවිය යුතු යම් මුදලක් ආපසු ගෙවීම හෝ ඒ මුදල මත අය විය යුතු පොලිය ගෙවීම පිළිබඳව මුදල් විෂයභාර අමාත්‍යවරයා ඇප විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සපයා ඇති ඇපයක් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය යම් මුදලක් පාර්ලිමේන්තුවේ පූර්ණ අනුමතිය ඇතිව ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති ඇපයක් සම්පූර්ණ කිරීමේ දී ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන යම් මුදලක් මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට සහ එසේ තීරණය කළ හැකි කාලසීමාවක් ඇතුළත අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන පොලියත් සමග ආපසු ගෙවනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති ඇපයක් සම්පූර්ණ කිරීමේ දී ඒකාබද්ධ අරමුදලින් යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවේ දී එකී මුදල එසේ ගෙවනු ලැබූ බවට ප්‍රකාශයක් මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් වහාම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 20අ වගන්තිය ඇතුළත් කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 20අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :-

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, සිදු කරන ලද යම් ක්‍රියාවක් සඳහා ආරක්ෂාව.

20අ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත අධිකාරියේ සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සඳහා ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ නියෝජිතයාට එරෙහිව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින් හෝ එයට එරෙහිව යම් අධිකරණයක් ඉදිරිපිට පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද

සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවන ලද හෝ එය විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු ආදිය අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "හය මසකට නොවැඩි කාලයකට" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට "එක් අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම ද, ඒ වරද නොකඩවා කරගෙන යන වරදක් නම්, වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් එක් දහසක අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.". ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "පොදු පහසුකම්" යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"පොදු පහසුකම්" යන්නෙන්, ජලය, මලාපවහන, ජලාපවහන, ගෑස්, විදුලි බලය, කුණුකසළ බැහැර කිරීම, වායු සමීකරණ, දුරකථන සහ ගුවන් විදුලිය සේවා සහ මාර්ග, ප්‍රවේශයන්, තණ පිට්ටනි, ගෘහ උද්‍යාන, උද්‍යාන, ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ප්‍රදේශ ඇතුළත් වේ ;';

(2) "පොදු අංගෝපාංග" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

'"පොදු අංගෝපාංග" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත මගින් එයට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;';

(3) "පොදු අංගෝපාංග" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :-

'"සහාධිපත්‍ය පිඹුර" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත මගින් එයට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;';

(4) "සහාධිපත්‍ය දේපළ" සහ "නිවාස යෝජනා ක්‍රමය" යන යෙදුම්වල අර්ථ කථනය අත්හැරීමෙන් ;

(5) "පළාත් පාලන ආයතනය" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :–

"'පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතලවලට සහ ඉටු කරනු ලබන කාර්ය සහ කර්තව්‍යවලට අනුරූප හෝ සමානවන බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද හෝ සාදන යම් අධිකාරියක් ද ඊට අයත් වේ ;';

(6) "පළාත් පාලන ආයතනය" යන යෙදුමේ අර්ථ කථනය ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :–

"'කළමනාකාර සංස්ථාව" යන්නෙන්, සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක පෙන්නුම් කර ඇති බෙදන ලද ගොඩනැගිලි එකකට හෝ ඊට වැඩි ගණනකට අදාළව ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ ඒ ගොඩනැගිලි සඳහා පිහිටුවනු ලැබූ කළමනාකරණ සංස්ථාව අදහස් වේ ;';

(7) "කළමනාකරණ සංස්ථාව" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :–

"'අයිතිකරු" යන්නෙන්, යම් ඉඩම් කොටසක් බෙදීමට පෙර එම ඉඩම් කොටසේ අයිතිකරු අදහස් වේ ;'

"සහාධිපත්‍ය කොටසේ අයිතිකරු" යන්නෙන්, තත් කාලයෙහි නිදහස් අයිතිය ඇති සහාධිපත්‍ය කොටසක ලියාපදිංචි අයිතිකරු හෝ සහාධිපත්‍ය කොටසක

බදු අයිතියක් ඇති කර ඇති අවස්ථාවක, එම බදු අයිතිය ලියාපදිංචි කිරීමේ දින සිට ගණන් බලනු ලබන අවුරුදු විස්සකට නොඅඩු කාලයක් ඇති සහාධිපත්‍ය දේපළේ බදු අයිතිකරු අදහස් වේ ;

''කොටස'' යන්නෙන්, සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක ස්වාධීන සහාධිපත්‍ය කොටසක් ලෙස පෙන්නුම් කර ඇති වූ ද මහල් එකකට වැඩි ප්‍රමාණයක් ඇති ගොඩනැගිල්ලක මහල් එකක් හෝ ඊට වැඩි ගණනක් සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක පදිංචිව සිටිය ද කාමර එකක් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වන්නා වූ ද ස්වාධීනව භාවිත කිරීම සඳහා නිර්මාණය කර ඇත්තා වූ ද නිර්නය කරන ලද ඉඩ ප්‍රමාණයක් අදහස් වන අතර එවැනි යම් පිඹුරක උපකාරක කොටසක් ලෙස නිශ්චිතව දක්වා ඇති කොටසක් එහෙත් ඒ නිර්නය කරන ලද ඉඩ ප්‍රමාණයේ සිට මාර්ගයකට යා හැකි හෝ මාර්ගයකට යොමු වූ පොදු ප්‍රදේශයකට කෙලින් ම පිටවීමේ මගක් තිබිය යුතු අතර වුව ද ඒ ඉඩ ප්‍රමාණය ඔස්සේ ඒ ආකාරයේම වූ අන්කිසි නිර්නය කරන ලද ඉඩ ප්‍රමාණයකට යා හැකි නොවිය යුතු ය ;';

(8) ''නියමිත'' යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'''අනාගත මිලදී ගන්නා'' යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත මගින් එයට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

''පළාත් සභාව'' යන්නෙන්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

''තාවකාලික සහාධිපත්‍ය පිඹුර'' යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත මගින් එයට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;';

(9) "රාජ්‍ය සංස්ථාව" යන යෙදුමේ අර්ථ කථනය අත්හැරීමෙන් ;

(10) "වාසය සඳහා වූ ඒකක" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"වාසය සඳහා වූ සහාධිපත්‍ය කොටස්" යන්නෙන්, සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක සංයුක්ත වන වාසය සඳහා වූ සහාධිපත්‍ය කොටස් අදහස් වේ ;';

(11) "වාසය සඳහා සහාධිපත්‍ය කොටස්" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කරනු ලැබුවා වූ ද, සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළ පිහිටියා වූ ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කය පිළිබඳ බලය ඇති වූ ද හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ ;';

(12) "රෙජිස්ට්‍රාර්වරයා" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"මහල" යන්නෙන්, ඉඩම් කොටසේ මතුපිටට ඉහළින් හෝ ඉඩම් කොටස මත හෝ ඊට පහළින් නැතහොත් ඉඩම් කොටසේ මතුපිටට කොටසක් පහළින් ද, කොටසක් ඉහළින් ද පිහිටියා වූ ද, යම් ස්වරූපයක ඉඩ ප්‍රමාණයකින් සංයුක්ත වන්නා වූ ද, දිග, පළල නිශ්චය කර ඇත්තා වූ ද ඉඩම් කොටසකින් යම් කොටසක් අදහස් වේ :

"අර්ධ සහාධිපත්‍ය පිඹුර" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත මගින් එයට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"බෙද වෙන් කරන ලද ගොඩනැගිලි" යන්නෙන්, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරිම සඳහා නීතිය මගින් බලය පවරා ඇති අධිකාරයක් විසින් අනුමත කරනු ලැබූ සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක සංයුක්ත වන්නා වූ ගොඩනැගිලි එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අදහස් වේ ;':

(13) "ගෙපත" සහ "ඒකකය" යන යෙදුම්වල අර්ථ කථනය අත්හැරීමෙන්.

(14) "නැවත බෙද වෙන් කරන ලද ගොඩනැගිලි" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුලත් කිරිමෙන් —

"අනවසර ඉදිකිරීම්" යන්නෙන්, ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමට නීතිය මගින් බලය පවරා ඇති බලධාරීන් ගෙන් වලංගු අවසර පත්‍රයක් නොමැතිව හෝ අදාළ සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ සඳහා අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්ම සම්බන්ධයෙන් නිකුත් කරන ලද අවසර පත්‍රයේ දක්වා ඇති යම් නියම හෝ කොන්දේසිවලට පටහැනිව සහාධිපත්‍ය කොටසට හෝ ඒ සහාධිපත්‍ය කොටසේ යම් සහායක කොටසක කරන ලද යම් වැඩි දියුණු කිරීමක් හෝ වෙනස් කිරීමක් ද පොදු අංගෝපාංගවලට කරන ලද යම් වැඩි දියුණු කිරීමක් හෝ වෙනස් කිරීමක් ද සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ ඉදිකර ඇති ඉඩම් කොටසේ යම් කොටස් කිරීමක් හෝ නැවත බෙදීමක් ද, සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ ඉදිකර ඇති ඉඩම් කොටස මත උප ව්‍යුහයන් සහ වෙනත් තැනීම් කටයුතු ඉදිකිරීම්, ඒ ඉඩම් කොටසට ඉහලින් හෝ ඊට පහලින් ගොඩනැගිල්ලෙන් පිටතට ඉදිකිරීම් කටයුතු කිරීම හෝ ඉඩම් කොටස හෝ යම් ගොනැගිල්ලක් හෝ යම් ව්‍යුහයක් භාවිත කරනු ලබන පරමාර්ථය වෙනස් කිරීම ;'.

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනය එකතු කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ :—

උපලේඛනය (9ඇ වගන්තිය)

i. අයිතිකරුගේ නම :-

ලිපිනය :-

ii. තාවකාලික සහාධිපත්‍ය පිඹුර
ලියාපදිංචි කිරීමේ දී ලබාදුන්
යොමු කිරීම :-

iii. උකස්කරුගේ හෝ
උකස් ලාභියාගේ
නම :-

iv තාවකාලික සහාධිපත්‍ය
කොටසේ එක් එක්
උකස යටතේ ලබාගත්
මුදල :-

v. පිහිටීම – දිස්ත්‍රික්කය
නගරය
වීදිය
වරිපනම් අංකය

vi. තාවකාලික
සහාධිපත්‍ය පිඹුර
අනුව මහල් සංඛ්‍යාව
සහ එක් එක් මහලේ
ඇති සහාධිපත්‍ය
කොටස් ප්‍රමාණය :-

vii. ....................................දින වන විට ප්‍රගතිය.

ව්‍යාවර්තන.

**25.** සැක දුරු කිරීමේ කාර්ය සඳහා –

(අ) මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක පැවැති පොදු පහසුකම් මණ්ඩලයේ සියලු කොන්ත්‍රාත්, ගිවිසුම් සහ වෙනත් සාධන පත්‍ර. සහාධිපත්‍ය, දේපළ කළමනාකරණ අධිකාරිය සමඟ ඇති කර ගත් කොන්ත්‍රාත්, ගිවිසුම් හෝ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) පොදු පහසුකම් මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබ මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පැවති සියලු සිවිල් නඩු, අපරාධ නඩු සහ වෙනත් නීති කෘතීන් සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ සිවිල් නඩු, අපරාධ නඩු සහ වෙනත් නීති කෘතීන් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පොදු පහසුකම් මණ්ඩලයේ සියලු අයිතිවාසිකම්, බැදීම් සහ වගකීම් සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියේ. අයිතිවාසිකම් බැදීම් සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය :

(ඈ) යම් නඩුවක දී හෝ නීති කෘතියක දී යම් අධිකරණයක් විසින් පොදු පහසුකම් මණ්ඩලයට පක්ෂව හෝ එරෙහිව සටහන් කරන ලද සෑම තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක් මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට බලපවත්වන පරිදි සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියට පක්ෂව හෝ ඊට එරෙහිව සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ;

(ඉ) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පොදු පහසුකම් මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ධුරය දරන්නා වූ සෑම නිලධරයකු හෝ සේවකයකු ම මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියේ නිලධරයකු හෝ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඊ) පොදු පහසුකම් මණ්ඩල පනත යටතේ සාදනු ලැබ මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද සෑම නියෝගයක්ම මේ පනත යටතේ සාදන ලද නියෝග ලෙස ස්ලකනු ලැබිය යුතු අතර, එම නියෝග ඒ අනුව මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් සංශෝධනය කිරීම, එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට ඉහතින් ම වූ දිනයේ දී ධුර දැරූ මණ්ඩලයේ සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයේ දී එම ධුර දැරීම අවසන් විය යුතු බව.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව වූ දිනයේ දී මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධුර දැරූ සෑම තැනැත්තෙක්ම ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන් වුව ද මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයේ දී ධුර දැරීම අවසන් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**27.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.